**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව**

**රත්නපුර දිස්ත්‍රික්කය**

**----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**---------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 20 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 19 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජූලි 14 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

**--------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**----------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

**------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව ණයහිමියන් සඳහා රු. 28,700 ක් අඩුවෙන් වෙන්කිරීම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට වූ ණයහිමි වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ කලින් ලද ආදායම් රු. 120,700 කින් වැඩියෙන් දැක්වුණි.

(ඇ) වෙළඳ බලපත්‍ර ආදායමෙහි බිල්කිරීම් වල මුළු වටිනාකම රු. 241,610 ක් වුවද, එය රු. 281,530 ක් ලෙස සටහන් කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු. 39,920 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2015 වර්ෂයේදී සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවන ලද රු. 297,873 ක් සමාලෝචිත වර්ෂයේ වියදමට ගලපා නොතිබූ අතර, සමාලෝචිත වර්ෂය තුලදී ඉදිරි වර්ෂය වෙනුවෙන් ගෙවන ලද රු. 265,200 ක් සමාලෝචිත වර්ෂයේ වියදමට ඇතුලත් කර තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේ වියදම රු. 32,673 ක් අඩුවෙන් දක්වා තිබූ අතර, ඉදිරි වර්ෂ වෙනුවෙන් ගෙවන ලද වියදම පෙර ගෙවුම් ගිණුම තුල ගිණුම්ගත කර නොතිබුණි.

**1.3.2 නොසැසඳූ පාලන ගිණුම්**

**---------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ගිණුම් විෂයයන් 04 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 4,029,926 ක වෙනසක් පැවතුණි.

(ආ) වැය විෂයයන් 10 කට අදාලව වැය ලෙජරය හා මූල්‍ය ප්‍රකාශන අතර රු. 312,792 ක වෙනසක් නිරීක්ෂණය විය.

**1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**

**----------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සේවක ණය ලේඛනය අනුව විශ්‍රාම ගිය සහ ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 21 දෙනෙකුගෙන් 1996 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල වූ රු. 162,850 ක සේවක ණය ශේෂයක් අයකර ගැනීමට 2016 දෙසැම්බර් 31 දින වනවිටද විධිමත් පියවර ගෙන නොතිබුණි.

(ආ) සභාවට අයත් ට්‍රැක්ටර් රථය 2015 වසරේ කෙටේතැන්න කසළ බැහැර කරන ස්ථානයේදී පෙරලී සිදුවූ අනතුර සම්බන්ධයෙන් රක්ෂණ සමාගම එකඟ වූ මුදලින් රු. 79,175 ක් 2017 ජනවාරි 27 දින වනවිටද ලැබිය යුතුව පැවතුණි.

(ඇ) ණයහිමි ලේඛනය අනුව 2016 ඔක්තෝබර් 06 දින වනවිට එකතුව රු. 20,048,165 ක ණයහිමි ශේෂයක් පැවති අතර, එම ණය ශේෂ  නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

---------------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වර්ෂ ගණනාවක සිට පැවත එන එකතුව රු. 480,930 ක් වූ ගිණුම් ශේෂ 02 ක වටිනාකම් සනාථ කිරීමට අදාල විස්තරාත්මක උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

(ආ) 2015 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ නොසැසඳූ පාලන ගිණුම් යටතේ දක්වා තිබුණු රු. 132,088 ක් වූ සේවක ණය ගිණුමේ වෙනස සමාලෝචිත වර්ෂයේදී සමුච්චිත අරමුදලට ගලපා තිබුණද වෙනසට හේතු ඉදිරිපත් කර නොතිබුණි.

**1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

---------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| (i) 24 වන වගන්තියේ 1(අ) හා (ආ) උප වගන්ති | සභාව මඟින් සීමා ලකුණු කර පාරවල් සහ පටු මාවත් පිළිබඳ නාම ලේඛනයක් පලකිරීමට කටයුතු කලයුතු වුවත්, 1962 වර්ෂයේ අප්‍රේල් 05 දිනෙන් පසු සභාව සතු මාර්ග ගැසට් කිරීමට හෝ ඒ පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා විධිමත් පියවර ගෙන නොතිබුණි. |
| (ii) 126 (ix) (ආ) වගන්තිය | කසළ ශෝධනය සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා ක්‍රියාත්මක කිරීමට හා ඝන අපද්‍රව්‍ය ක්‍රියාකාරී සැලැස්ම 2014-2016 හි අනු අංක 01 යටතේ 2014 වර්ෂය තුලදී ඉටු කර ගැනීමට අපේක්ෂිත කාර්යයක් වශයෙන් දක්වා තිබූ ඉලක්ක සපුරා ගැනීමට 2016 වර්ෂය වනවිටත් සභාව අපොහොසත්වී තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 571(2)(3) | කල් ඉකුත් වූ රු. 1,197,883 ක් වූ තැන්පතු නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 760 | 2015 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේ දී අනාවරණය වී තිබුණු ලී බඩු, උපකරණ හා යන්ත්‍රෝපකරණ විෂයයන් 03 ක ඌනතාවය සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසි වලට අනුකූලව අංක 1533/16 දරන 2008 ජනවාරි 25 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ “ඇ” කොටසේ නියමිත ව්‍යාපෘති සම්බන්ධයෙන් පරිසර ආරක්ෂණ බලපත්‍රයක් නිකුත් කිරීමේදී පළාත් පාලන ආයතන වලට බලතල පවරා දීම සහ බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳ උපදෙස් මාලාවේ 3.3.1 හා 4.2 උප වගන්ති | පරිසර ආරක්ෂණ බලපත්‍රයක වලංගු කාලය වූ වර්ෂ 03 අවසන් වනවිට නැවත අළුත් කිරීමට කටයුතු කල යුතු නමුත් සභාව විසින් 2012 හා 2013 වර්ෂයන්හි නිකුත් කරන ලද නව බලපත්‍ර හා අළුත් කිරීම් ලද බලපත්‍ර 07 ක් සම්බන්ධයෙන් නැවත අළුත් කිරීමට කටයුතු කර නොතිබූ අතර, සභා බල ප්‍රදේශය තුල අළුතින් ආරම්භ කර ඇති කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් සිදුකර බලපත්‍ර ලබාදීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | 2011 පෙබරවාරි 24 දිනැති විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අංක 02/2011 චක්‍රලේඛය | |
| | 4.1 වගන්තිය | සියළුම පළාත් පාලන ආයතන විසින් අනියම් හා තාවකාලික පදනමින් බඳවාගනු ලබන කාර්යය මණ්ඩල රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් සඳහා දායක කර තිබිය යුතු බවට දන්වා තිබියදී අනියම් හා තාවකාලික පදනමින් බඳවා ගන්නා ලද සේවකයින් 21 දෙනෙකු වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයින්ගේ භාර අරමුදල වෙත දායකමුදල් ගෙවා තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 6,357,735 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 5,395,358 ක් වූ බැවින් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයේ රු. 962,377 ක වර්ධනයක් දක්නට ලැබුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලය රු. 962,377 කින් වැඩිවීම කෙරෙහි ආදායම් විෂයයන් 02 ක රු. 1,323,258 ක වර්ධනය හා වියදම් විෂයයන් 03 ක රු. 279,004 ක අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000' | රු. 000' | රු. 000' |
| වරිපනම් හා බදු | 5,828 | 7,375 | 9,269 |
| බදු කුලී | 2,876 | 1,860 | 1,619 |
| බලපත්‍ර ගාස්තු | 386 | 643 | 14 |
| වෙනත් ආදායම් | 69,799 | 40,185 | 20,230 |

**2.3.2. ආදායම් රැස්කිරීමේ කාර්යයසාධනය**

**----------------------------------------**

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් බදු, බලපත්‍ර ගාස්තු හා සේවා සඳහා ගාස්තු යන ආදායම් විෂයයන්ගෙන් රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 23, සියයට 63 හා සියයට 64 කින් වැඩි වී තිබූ අතර බදුකුලී ආදායම, වරෙන්තු හා දඩ, වෙනත් ආදායම් හා රජයේ දායකත්වය යන ආදායම් විෂයයන්ගේ ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 03, සියයට 25, සියයට 61 හා සියයට 54 කින් අඩුවී තිබුණි.

**2.3.3 වරිපනම්**

**---------**

2016 ජුනි 30 දින වනවිටත් වරිපනම් ඒකක 3,455 කින් රු. 4,428,288 ක හිඟ ශේෂයක් තිබූ අතර, එහි රු. 5,000 ට වඩා වැඩි ඒකක 114 කට අදාලව රු. 967,937 ක හිඟ ශේෂයක් විය. එය මුළු හිඟයෙන් සියයට 21 ක් බව නිරීක්ෂණය කෙරේ.

**2.3.4 බදුකුලී**

**--------**

සභාව විසින් බදු දී තිබූ කඩකාමර 04 කින් 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාලව රු. 297,368 ක් වූ හිඟ බදුකුලී 2016 ඔක්තෝබර් 05 දින වනවිටද අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

**2.3.5 වෙනත් ආදායම්**

**-----------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා බල ප්‍රදේශයේ අක්කර බදු ඒකක 126 කින් රු. 64,759 ක හිඟ ශේෂයක් තිබූ අතර, 2016 ඔක්තෝබර් 05 දින වනවිටත් හිඟ ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශය තුල පවතින කර්මාන්ත හා ව්‍යාපාර පිළිබඳ සමීක්ෂණයක් සිදුකර ලේඛනයක් නඩත්තු කල යුතු වුවත්, එසේ නොකර සභාව වෙත පැමිණ ගෙවීම් කරන ව්‍යාපාර හා කර්මාන්ත බදු පමණක් ලේඛනගත කර තිබුණි. තවද, ඉකුත් වර්ෂයට සාපේක්ෂව ස්ථාන 186 කින් 2016 වර්ෂය සඳහා 2016 ඔක්තෝබර් 05 දින වනවිටත් ව්‍යාපාර බදු, කර්මාන්ත බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු අයවී නොතිබුණි.

(ඇ) 2014 ඔක්තෝබර් 16 දිනැති මහා සභා රැස්වීම් තීරණ අංක 13 පරිදි දෛනික කසළ ජනනය මත 2015 වර්ෂයේ සිට සංශෝධිත කසළ බදු ගාස්තු අය කිරීමට තීරණය කර තිබුණද, 2016 ඔක්තෝබර් 05 දින වනවිටද පැරණි ගාස්තුව අයකර තිබූ නිසා සභාවට රු. 60,500 ක කසළ බදු ආදායමක් අහිමි වී තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 1986 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් සහ ගොඩනැගිලි නියෝගයන්ට කරන ලද සංශෝධනයන්හි V වන උපලේඛනය පරිදි දුරකථන සම්ප්‍රේෂණ ඉදිකිරීමේදී අයකල යුතු ගාස්තු වලට පටහැනි ලෙස සභා බල ප්‍රදේශයේ ස්ථාපිත සන්නිවේදන කුළුණු 15 කින් රු. 2,658,850 ක් අඩුවෙන් අයකර තිබුණි. ඊට අමතරව ඉදිකිරීම් 03 කට අදාලව ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තුව පමණක් අයකර තිබූ අතර නියමිත ගාස්තු අයකර නොතිබුණි.

## 2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

රත්නපුර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් 2015 ජනවාරි සිට 2016 ඔක්තෝබර් 05 දින දක්වා කාලපරිච්ඡේදයට අදාල මුද්දර ගාස්තු හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

## 3.1 කාර්යසාධනය

---------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 වර්ෂයේ අයවැය ලේඛනය අනුව ප්‍රාදේශීය සභා අරමුදල් යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා එකතුව රු. 2,261,083 ක වටිනාකමකින් යුත් කර්මාන්ත 14 ක් යෝජනා කර තිබූ නමුත් 2016 දෙසැම්බර් 31 දින වනවිටත් ඉන් කිසිඳු කර්මාන්තයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) වෙනත් මූලා ආධාර යටතේ එකතුව රු. 29,857,996 ක වටිනාකමකින් යුත් කර්මාන්ත 61 ක් අයවැය ගතකර තිබූ නමුත් ඉන් එකතුව රු. 444,653 ක් වැයකර කර්මාන්ත 03 ක් පමණක් නිමකර තිබුණි.

(ඇ) අයවැයට ඇතුලත් නොවූ කර්මාන්ත 25 ක්, රු. 11,259,681 ක් වැයකර ක්‍රියාත්මක කර තිබූ අතර පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ කර්මාන්ත 02 ක් රු.1 ,289,277 ක් වැයකර ක්‍රියාත්මක කර තිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**-----------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 1988 අගෝස්තු 23 දිනැති අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ IV (ආ) වැනි කොටසේ 39 වන පරිච්ඡේදයේ 01 අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක බලය යටතේ මිස දැන්වීම් ප්‍රදර්ශනය කරනු නොලැබිය යුතු වුවත්, සභා බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් පුවරු සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර සභාවේ ආදායම ඉහළ නංවා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ආ) 2016 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව වටිනාකම රු. 74,465 ක් වූ ලීබඩු හා යන්ත්‍රෝපකරණ වෙන්දේසි කිරීමට නිර්දේශ කර තිබුණද, ඒවා වෙන්දේසි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2016 අගෝස්තු බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව මාරපන උප කාර්යාලය හා ප්‍රධාන කාර්යාලය මඟින් බැංකුගත නොවූ පිළිවෙලින් රු. 8,915 ක් හා රු. 517,447 ක්වූ මුදල් හා චෙක්පත් සහ 2003 වර්ෂයේ සිට හඳුනාගත නොහැකි ශේෂයක් ලෙස සඳහන් කර තිබුණු රු. 259,296 ක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා බල ප්‍රදේශයට අයත් සුසාන භූමි 44 ක් පැවතියද, ඉන් සුසාන භූමි 06 ක් පමණක් සභාව වෙත පවරා ගෙන තිබූ අතර, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් වල පිහිටා තිබූ සුසාන භූමි 21 ක් සම්බන්ධයෙන් අදාල පවරා ගැනීමේ කටයුතු වල ප්‍රගතිය පහත් මට්ටමක පැවතුණි.

(ආ) 2015 ජූලි 27 දින ප්‍රාදේශීය සභාවේ නිලධාරීන් විසින් කෙටෙතැන්න ප්‍රදේශයේ අනවසර ඉදිකිරීම් ස්ථාන 14 ක් හඳුනාගෙන තිබූ අතර, එකී ඉදිකිරීම් වහාම නියමානුකූල කරගන්නා ලෙස වගකිව යුතු පාර්ශව වෙත 2015 අගෝස්තු මස දන්වා තිබුණද, ඒ සම්බන්ධයෙන් පසුවිපරම් කටයුතු සිදුකර නොතිබුණි. 2017 ජූනි වනවිට ලිපි යොමුකර වර්ෂයක කාලයක් ඉක්මවා තිබුණද එකී ඉදිකිරීම් නියමානුකූල කරගෙන නොතිබීම සම්බන්ධයෙන් සභාව විසින් ඉදිරි පියවරක් ගැනීම හෝ සිහිකැඳවීම් යොමු කිරීම කර නොතිබුණි. ඊට අමතරව පෙත්සම් මඟින් හඳුනාගෙන තිබූ අනවසර ඉදිකිරීම් 18 ක් සම්බන්ධයෙන්ද අදාල පාර්ශවයන් වෙත වාචිකව හා ලිඛිතව උපදෙස් ලබාදී තිබුණද, ඒ පිළිබඳ පසු විපරම් කටයුතු සිදුකර නොතිබුණි.

### 3.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

සභාවට අයත් කැබ් රථයක් දීර්ඝ කාලයක් තිස්සේ සභා භූමිය තුල නිෂ්කාර්යව ගාල්කර තිබුණු අතර, 2016 ඔක්තෝබර් 05 දින වනවිටත් අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 3.5 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සබරගමුව පළාත් සභාවේ පළාත් මාර්ග සංවර්ධන, ග්‍රාමීය යටිතල පහසුකම්, සංචාරක, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත රු. 489,931 ක් වැයකර ඉදිකර තිබූ මාර්ෂල් වැලිවත්ත පාර අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය 2016 ජනවාරි 10 දින නිමකර තිබූ අතර, 2016 ඔක්තෝබර් 05 දින සිදු කරන ලද භෞතික විගණන පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(i) මිනුම් වාර්තාවට අනුව මාර්ගයේ දිග මීටර් 61.85 ක් වුවත්, භෞතික පරීක්ෂාවට අනුව එය මීටර් 61 ක් වූ හෙයින් ඉටු නොකල මීටර් 0.85 ක් වෙනුවෙන් රු. 4,499 ක් ගෙවීම් කර තිබුණි.

(ii) මාර්ගයේ මුල සිට මැනීම් කටයුතු කිරීමේදී මුල් මීටර් 21 ඇතුලත සමස්ථ පළලටම පිපිරීමක් සිදුව තිබුණු අතර, මාර්ගයේ යම් යම් ස්ථානයන්හි මතුපිට පෘෂ්ඨයේ ගල් මතුවී තිබුණි.

(iii) උක්ත මාර්ගය එක් නිවසකට පමණක් පිවිසුම් මාර්ගයක් වී තිබුණි.

(ආ) 2014 දොරින් දොරට - ගමින් ගමට ජාතික සංවර්ධන වැඩසටහන යටතේ සබරගමුව පළාත් සභාව හරහා රු. 1,650,000 ක ඇස්තමේන්තු වටිනාකමකට ආරම්භ කරන ලද නාරංගොඩ නිදන්ගල බෝධි විහාරය අසලින් කුඩා පාලමක් ඉදිකිරීමේ කර්මාන්තය මූල්‍ය ප්‍රතිපාදන නොමැති වීම මත ඉදිකිරීම් නවතා තිබූ අතර, 2015 ජූනි 23 දින වනවිට කොන්ක්‍රීට් කණු 03 ක් සහ පැති බැම්මක් ඉදිකර තිබුණි. මෙම කර්මාන්තය සඳහා රු. 200,000 ක අත්තිකාරම් මුදල් නිදහස් කර තිබුණු අතර, මේ වනවිට අත්හැර දැමූ ව්‍යාපෘතියක් බවට පත්ව තිබුණි. ඊට අමතරව මෙම පාලමේ ප්‍රවේශ මාර්ගය ප්‍රමාණවත් පළලකින් යුක්ත නොවීම පිළිබඳව ඉකුත් විගණන විමසුම් වලින් පෙන්වා දුන් අතර විහාරවාසී ස්වාමීන්වහන්සේ සහ ගම්වාසීන්ගේ ප්‍රකාශ අනුව පෙර නොවූ අයුරින් වර්ෂාව සහිත කාල වලදී ගඟේ ගලාඑන අධික ජල ධාරිතාව ගලා යාමට මෙම ඉදිකිරීම් බාධා වීමත් සමඟ ගඟ උතුරා දෙපස ගොඩනැගිලි හා භූමිය ජලයෙන් යටවන බව අනාවරණය විය.

**3.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

---------------------------------

මධ්‍යම පරිසර අධිකාරිය මඟින් 2006 වර්ෂයේදී ප්‍රකාශිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව අපද්‍රව්‍ය භූමියට බැහැර කිරීමේදී අපද්‍රව්‍ය මතින් පස් හෝ වෙනත් එවැනි ද්‍රව්‍යයක් යොදා දෛනිකව වැසීමට කටයුතු කලයුතු වුවත්, සභාව විසින් එලෙස කටයුතු නොකරන බව අනාවරණය විය.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

----------------------------------------

**4.1 අයවැය පාලනය**

--------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 19 කට අදාලව එකතුව රු. 3,696,100 ක් වූ මුළු ප්‍රතිපාදනයම වියදම් නොවී ඉතිරි වී පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 07 කට අදාලව එකතුව රු. 3,575,000 ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 84 සිට සියයට 99.8 දක්වා පරාසයක ඉතිරිවීම් පැවතුණි.

## 4.2 නොවිසඳී ඇති හා පිළිතුරු නොදුන් විගණන විමසුම්

2016 දෙසැම්බර් 31 දින වනවිට ගණනය කල හැකි වටිනාකම වූ රු. 5,001,434 ක් වන විගණන විමසුම් 04 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

## 4.3 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය වෙනුවෙන් සභාව සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනය

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| | පද්ධතිය | | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | වර්ගීකරණ දෝශ |
| | | (ii) | වෙන්කිරීම සිදු නොකිරීම |
| | | (iii) | වැඩියෙන් සටහන් කිරීම |
| | | (iv) | ලෙජර් ගිණුම් හා උපයෝගී ලේඛන නොසැසඳීම |
| (ආ) | ආදායම් පරිපාලනය | | නියමිත ආදායම අයකර නොගැනීම |
| (ඇ) | වත්කම් පාලනය | | නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් පැවතීම |
| (ඈ) | කොන්ත්‍රාත් පරිපාලනය | | ඉටු නොකල කාර්යයන් සඳහා ගෙවීම් කිරීම |
| (ඉ) | අයවැය පාලනය | | ප්‍රතිපාදන ඉතිරිවීම |
| (ඊ) | සන අපද්‍රව්‍ය කළමනාකරණය | | විධිමත් ලෙස බැහැර නොකිරීම |